චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 ව්‍යාපෘතිය (අදියර II) - 2019

චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 ව්‍යාපෘතිය (අදියර II) හි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැදගත් මාර්ග ප්‍රවේශයන් සහ ගුණාත්මක ප්‍රවාහන යටිතල පහසුකම් සහ සේවාවන් සැපයීම සඳහා දැනට පවතින ජාතික මාර්ග සහ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම/පුනරුත්ථාපනය කිරීම තුලින් ප්‍රදේශයේ වෙසෙන ජනතාවට සමාජීය සහ ආර්ථික ප්‍රතිලාභ රැසක් ලබා දීම ව්‍යාපෘතියේ පරමාර්ථ වේ. ණය පහසුකම් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 15,594.14 කට සමාන එ.ජ.ඩො. මිලියන 117.66 ක් වූ අතර ඉන් රු. මිලියන 13,253 කට සමාන එ.ජ.ඩො. මිලියන 100 ක් සැපයීමට චීනයේ චීන සංවර්ධනය සංස්ථාව එකඟ වී තිබුණි.

## 1.3 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්ය සාධනය

### 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ප්‍රගති වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට සී 38-වීඕ, සී 39-වීඕ, සී 40-වීඕ සහ සී 41-වීඕ යන කොන්ත්‍රාත් පැකේජ යටතේ මාර්ග පුනරුත්ථාපනය කිරීම් පිළිවෙළින් සියයට 70 ක්, සියයට 94 ක්, සියයට 12 ක් සහ සියයට 10 ක් පමණක් අවසන් කර තිබුණි. | ව්‍යාපෘතිය මගින් අනවශ්‍ය වියදම් දැරීමට ඇති හැකියාව. | විගණන වාර්තාවේ සඳහන් විචලතා 04 සම්බන්ධ වැඩකටයුතු විවිධ කාල පරිච්ඡේදවල ආරම්භ කර ඇති අතර ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය වෙනස් වනු ඇත. කෙසේ වෙතත්, අවසන් කිරීමේ ප්‍රතිශතය සමඟ එකඟ වෙමි. | මාර්ගවල ඉතිරි පුනරුත්ථාපන කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ විෂය පථයට අයත් නොවූ තංගල්ල - වීරකැටිය සහ වීරකැටිය - මිද්දෙණිය මාර්ග ඉදිකිරීම සඳහා රු. මිලියන 210 ක මුදලක් වැය කර තිබුණි. තවද, මෙම මාර්ග දෙකෙහි භාරදීමේ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ පිරිවැය වැඩිවීමට ඇති හැකියාව. | 2015 ජනවාරි 08 න් පසුව මාර්ගයේ ඉදිකිරීම් අත්හිටුවා ඇත. ඒ අනුව කොන්ත්‍රාත් ක්‍රියාවලිය අත්හිටුවා කොන්ත්‍රාත්කරු එම ස්ථානයෙන් ඉවත් කරන ලදී. එම නිසා මෙම මාර්ග දෙක සඳහා භාරදීමේ සහ භාර ගැනීමේ සහතික පත්‍ර හුවමාරුවී නොමැත. | පුනරුත්ථාපන කටයුතු අවසන් කිරීම සහතික කිරීමට අවශ්‍ය පියවර ගත යුතු අතර ව්‍යාපෘති විෂය පථයෙන් බැහැරව සිදු කෙරෙන කාර්යයන් අවම කළ යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති කොන්දේසිවලට පටහැනිව, කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන ඇපකරයේ පිරිවැය අයකරගත හැකිවන පරිදි මාර්ග පුනරුත්ථාපන කටයුතු පිළිබඳ ප්‍රමාණ පත්‍රයේ වෙනම ගෙවීම් අයිතම සකස් කර තිබුණි. ඒ අනුව කාර්ය සාධන ඇපකරවල පිරිවැය | කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය වාසි අත්වීම.. | කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමට පෙර කාර්ය සාධන ඇපකරය අවශ්‍ය වන අතර, සාර්ථක ලංසුකරුවෙකු ගිවිසුමකට එළඹීමට පෙර කාර්ය සාධන ඇපකරය ලබා ගැනීම සඳහා වියදම් දැරීමට | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර, ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන **2.59** ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට අතිරේකව ගෙවා තිබුණි. | | අවශ්‍ය වේ. | |
| (ඇ) | ජාතික අයවැය චක්‍රලේඛ අංක **06/2015** අනුව, ඔවුන්ට පැවරී ඇති රාජකාරි අනුව ඒක පුද්ගල කාර්යසාධනය හඳුනාගැනීමට හැකිවන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. තවද, **2019** වර්ෂය සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරිත්වයට අදාල තීරණාත්මක කාර්යයන් හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමස්තයක් ලෙස ව්‍යාපෘතියේ ප්‍රගතිය ඵලදායි ලෙස නිරීක්ෂණය කිරීමට සහ ඇගයීමට නොහැකිවී තිබුණි. | ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | ජාතික අයවැය චක්‍රලේඛ අංක **06/2015** ට අනුකූලව **Ms Project** මෘදුකාංගය භාවිතයෙන් සැලසුම් අංශයේ අවශ්‍යතාවය අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු අතර ව්‍යාපෘතියේ ප්‍රගතිය ඵලදායී ලෙස නිරීක්ෂණය කර ඇගයීමට ලක් කළ යුතුය. |